**හලාවත ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

**(අ) නොසැසඳුණු ගිණුම්**
**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05කට අදාළව පවත්වා තිබුණු උපලේඛන හා උපයෝගි පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම් එකතුව රු.12,465,790ක් විය. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් හා උපලේඛන නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-------------------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු ගිණුම් ශේෂ 09ක එකතුව රු.234,296,037ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.31,127,744ක් විය. | තව දුරටත් අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනටමත් වරිපනම්, අක්කර බදු, කඩ කුලී හා උසාවි දඩ හිඟ මුදල් කොටසක් අය කරගෙන ඇත. ඉදිරියේදී අනෙකුත් ලැබිය යුතු ගිණුම් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.68,389,927ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ගෙවිය යුතු ශේෂය රු.4,728,236ක් විය. | ණයහිමි ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සියළුම ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.168,287,764ක් වූ ගිණුම් විෂයයන් 02ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | 2020 වර්ෂයේ ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කරන බවත් පුස්තකාල පොත් සඳහා උපලේඛන සකස් කර 2020 මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන බවත් කාරුණිකව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 129(2) (ඊ) වගන්තිය | සභාවට ලැබිය යුතු රු.987,847ක් වූ කුලී විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | තවදුරටත් අයවිය යුතු කුලී මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩකුලී හිඟවලින් කොටසක් දැනටමත් අයකරගෙන ඇති අතර අයවීමට ඇති ඉතිරි හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 217 හා 218 රීති | සභාවට අයත් රු.167,363,747ක් වූ සියළු ඉඩම් හා | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය | 2020 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණයද සිදුකර නොතිබුණි. | යාවත්කාලීනව පවත්වා වාර්ෂිකව සමීක්ෂණ සිදු කළ යුතු වේ. | සමීක්ෂණයක් සිදුකර ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| (i)396 (ඇ) වගන්තිය | නිකුත් කර මාස 06 ඉකුත් වූ රු.43,558ක් වූ චෙක්පත් 09ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මාස 06ක් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii)571 වගන්තිය | වසර 02ක් ඉක්මවූ රු.5,278,623ක් වූ තැන්පතු 268ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වසර 02ක් ඉක්මවූ තැන්පතු සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.80,787,587ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,388,780ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ගොඩනැගිලි සංවර්ධන අරමුදල සහ ජල හා සනීපාරක්ෂක අරමුදල නමින් ඉතිරිකිරීමේ ගිණුම් 02ක් මහජන බැංකුවේ පවත්වාගෙන යන අතර ඒවායේ මුදල් වැඩි | ඉතිරි කිරීම් ගිණුම්වල ශේෂයන් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජනය කළ | ගොඩනැගිලි සංවර්ධන අරමුදල හා ජල සනීපාරක්ෂක අරමුදල යටතේ ඇති ඉතිරි කිරීමේ ගිණුම් දෙකෙහි පවතින මුදල් ස්ථාවර තැන්පත් ගිණුම් දෙකක ආයෝජනය කිරීම සඳහා මේ වන විට |

| | | |
|---|---|---|
| ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජන ගිණුමකට මාරු නොකිරීම නිසා එම ගිණුම්වල රඳවා තිබුණු ශේෂය 2019 දෙසැම්බර් 31 දිනට රු.1,137,285ක් විය. | යුතු වේ. | කටයුතු කරගෙන යමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,582 | 4,730 | 4,490 | 2,646 | 4,642 | 4,723 | 4,538 | 2,414 |
| කුලී | 7,128 | 7,279 | 7,039 | 1,006 | 5,982 | 6,681 | 6,760 | 567 |
| බලපත්‍ර ගාස්තු | 1,080 | 1,292 | 1,292 | - | 765 | 1,222 | 1,222 | - |
| වෙනත් ආදායම් | 207,946 | 194,717 | 131,188 | 227,502 | 142,072 | 126,163 | 122,581 | 136,515 |
| | 220,736 | 208,018 | 144,009 | 231,154 | 153,461 | 138,789 | 135,101 | 139,496 |

*රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුළු බිල්කළ ආදායම රු.208,017,284ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ ආදායම රු.139,494,868ක් වූ අතර එයින් රු.144,008,540ක් පමණ වර්ෂය තුල රැස්කර තිබුණි. ඒ අනුව සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 41ක් පමණ විය. | වර්ෂයේ බිල්කළ ආදායම් වර්ෂය තුල අයකළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් හා බදු ආදායම වූ රු.4,729,584න් වර්ෂය තුලදී රු.3,333,906ක් පමණක් රැස්කර තිබුණු අතර එය බිල්කළ වටිනාකමින් සියයට 70කි. සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට හිඟව තිබුණු රු.2,413,598ක වරිපනම් හා බදු වටිනාකමින් වර්ෂය තුලදී රු.1,156,163ක් පමණක් රැස්කර තිබුණු අතර එය වර්ෂය ආරම්භයේ හිඟහිටි වටිනාකමින් සියයට 48ක ප්‍රමාණයක් විය. | වර්ෂයට අදාළව බිල්කළ වරිපනම් හා බදු වර්ෂය තුලදීම අයකළ යුතු වේ. | 2019 වර්ෂයේ බිල්කළ වරිපනම් බදු හා හිඟ වරිපනම් බදුවලින් 2020 වර්ෂය තුළ රු.511,275ක මුදලින් රැස්කර ඇත. |

### 2.3.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයට පෙර සිට පැවත එන අයවීම ඇණහිට තිබුණු රු.416,398ක බදු මුදල් හා 2014 වර්ෂයේ සිට හිඟව පවතින රු.181,347ක් වූ විශ්‍රාම ශාලා කුලී මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු අතර අයවීම ඇණහිට ඇති කුලී කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | බදු කුලීවල රු.416,397ක මුදලක් අයකර ගත නොහැකි මට්ටමේ පවතින අතර, 2014 වර්ෂයේ සිට පැවත එන රු.181,347ක මුදල සඳහා නඩු ගොනු කිරීමට කිහිපවිටක් උත්සාහ කළද විධිමත් ගිවිසුමක් නොමැතිකම නිසා එය අසාර්ථක වී ඇත. |

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.34,389,059ක් හා මුද්දර ගාස්තු රු.184,979,717ක් විය. | තවදුරටත් අයවිය යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු සඳහා ඉල්ලීම් සිදුකර අදාළ මුදල් හැකි ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කාර්යසාධනය

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා පනවා අදාළ සේවාවන් මහජනතාව වෙනුවෙන් ඉටුකළ යුතුව ඇතත් සභාව සතු පාරවල්, මංමාවත් සහ ඉඩම් හා දේපළ කළමනාකරණය හා නඩත්තුව සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාළ අතුරු ව්‍යවස්ථා පනවාගෙන මහජන සුහසාධනය වෙනුවෙන් සේවා සැපයිය යුතු වේ. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවා අදාළ සේවාවන් මහජනතාව වෙනුවෙන් ඉටුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම්කර තිබුණු රු.8,215,000ක් වූ ව්‍යාපෘති හා වැඩසටහන් 07ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | වර්ෂය තුල සැලසුම් කළ ව්‍යාපෘති වර්ෂය තුලදීම ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අයවැය ලේඛනයට සැලසුම් කළද එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා එවක රටේ පැවතුණු අනාරක්ෂිත වාතාවරණය අනුව එම වැඩසටහන් කිරීමට හැකියාවක් නොමැති වූ බව දන්වා සිටිමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** --

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රෝග මර්ධනය, දිළිදුකම පිටුදැකීම, කසළ කළමනාකරණය හා වෙරළ සංරක්ෂණය යටතේ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන වැඩසටහන් ක්‍රියාත්මකකර තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ ලැබී තිබුණු රු.27,000ක් වූ මුදල් ඇණවුම් 39ක් සහ ඊට පෙර වර්ෂවල ලැබී තිබුණු රු.2,500ක් වූ මුදල් ඇණවුම් 2020 මැයි 13 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාළ මුදල් ඇණවුම් ලබාගෙන තිබුණද ඒවා ගිණුමට බැරවී නොමැති බැවින් ඒ පිළිබඳව සොයා බලා එය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) | හලාවත ඉණිගොඩවෙල පාසල් භූමිය පැවරීම සඳහා හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත 2000 වර්ෂයේදී ගෙවා තිබුණු රු.25,000ක අත්තිකාරම් මුදල 2020 මැයි 13 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හලාවත ඉනිගොඩවෙල පාසල් භූමිය පැවරීම් සම්බන්ධයෙන් හලාවත ප්‍රාදේශිය ලේකම්තුමාට ලබාදී තිබුණු අත්තිකාරම් මුදල රජයේ ආදායමට බැරකර ඇති බව දන්වා ඇත. එම මුදල ලේඛනවලින් කපාහැරීම සඳහා මහ සභා අනුමැතියක් ලබාගෙන ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බව තවදුරටත් දන්වා සිටිමි. |
| (ඇ) | වර්ෂ 2004-2016 කාලය තුල සභා බල ප්‍රදේශයේ කට්ටිකර විකිණූ ඉඩම්වලින් පොදු කටයුතු සඳහා සභාවට වෙන් කර තිබුණු | සභාවට අයත් ඉඩම් කොටස් හඳුනාගෙන ඔප්පු මගින් පවරා | විගණනය විසින් පෙන්වා දුන් පරිදි 2004-2016 වර්ෂ කාලය තුලදී සභාව වෙත ලැබුණු පොදු ඉඩම්වල අදාළ ඔප්පු ගෙන්වා |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් කොටස් 08ක ඔප්පු සභාවට පවරාගෙන නොතිබුණි. තවද මෙම ඉඩම් කොටස් මායිම් යොදා ආරක්ෂාකර ගැනීමේ ඵලදායි වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. | ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගැනීම සඳහා මේ වන විට එම ආයතනයන් වෙත ලිඛිතව දැනුම්දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | 2005 වර්ෂයේ කට්ටිකර අලෙවිකර තිබුණු කරුක්කුවටවන කජුකැලේවත්ත නැමති ඉඩමෙන් පොදු කටයුතු සඳහා සභාවට වෙන්කර දී තිබුණු නමුත් ඔප්පුවකින් පවරා දී නොතිබුණු පර්චස් 115ක බිම් කොටසින් පර්චස් 60ක් පමණ දේපළ සමාගම විසින් කූඨ ලේඛන සකසා 2018 වර්ෂයේ වෙනත් පුද්ගලයෙකු වෙත අලෙවි කර තිබුණි. | පොදු කටයුතු සඳහා සභාවට වෙන්කර ඇති ඉඩම් කොටස් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වෙන්දේසි ඉඩමෙන් පොදු භූමියෙහි ඔප්පු ලබාගැනීම සඳහා මේ වන විටත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මෙම ඉඩමෙහි වටිනාකමට සමාන වටිනාකමක් මුදලින් ලබාදීමට ඉඩම මේ වන විට අයිතිව සිටින අයවළුන් විසින් කැමැත්ත ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතුද සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඉ) | සභාවේ ලියාපදිංචි ත්‍රීරෝද රථ ගාල්වල ත්‍රීරෝද 282කින් 2018 වර්ෂය සඳහා රු.155,100ක් සහ 2019 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ 295කින් රු.162,250ක් වශයෙන් රු.317,350ක මුදලක් අයකරගෙන නොතිබුණි. | සියළු ත්‍රීවීල් රථගාල් පිළිබඳ විධිමත් සංගණනයක් සිදු කර ගාල් කරන ත්‍රීවීල් රථ පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සියළුම රථගාල්වල සාමාජිකයින් පිළිබඳ සංගණනයක් සිදු කර ස්ථිර වශයෙන්ම සිටින සාමාජිකයින් හඳුනාගෙන මුදල් අයකර ගැනීමට පියවර ගන්නා බවත් අප විසින් වාර්ෂිකව මුදල් අයකරනු ලබන්නේ බලපත්‍ර ගාස්තු වශයෙන් නිසා හිඟ ගාස්තු අයකිරීමේ ක්‍රමවේදයක් නොමැති බවද සඳහන් කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002-2011 කාල වකවානු තුල වත්කම් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.416,398ක බදු මුදලක් අදාල කාල සීමා තුළ අයකර ගැනීමට නිසි පියවර නොගැනීම මත වර්තමානයේ අයකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් සභාවට අලාභයක් සිදුවී තිබුණි. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2002-2016 කාල වකවානුවල සිට බදුකුලීවල පවතින රු.416,398ක මුදල අතීතයේ අයකර නොතිබීම හා ගිවිසුම් නොමැතිවීම නිසා අයකර ගත නොහැකි වී ඇති අතර එය කපා හැරීමට පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. එය හැකි ඉක්මනින් ගරු |

| | | |
|---|---|---|
| | | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කරමි. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් තනතුරු 29ක පුරප්පාඩු පවතින අතර තාක්ෂණ නිලධාරි, වැඩ පරිපාලක, ආදායම් පරීක්ෂක වැනි සභාවේ ප්‍රධාන කාර්යයන් සඳහා අදාළ තනතුරුද ඒ අතර විය. තවද ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු 01ක අතිරික්ත කාර්යය මණ්ඩලය 04ක් වූ අතර අතිරික්ත තනතුරු අනුමතකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | පුරප්පාඩු තනතුරු සඳහා විධිමත් ලෙස බඳවා ගැනීමටද අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු තනතුරු පිරවීම හා අතිරේක තනතුරු අනුමත කර ගැනීම සඳහා අදාළ අනුමැතීන් ලබා ගැනීමට ඉදිරිපත්කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට අය නොවන සේවක ණය ශේෂය රු.783,792ක් විය. බොහෝමයක් ණය ශේෂ පිළිබඳව තොරතුරු සභාව සතුව නොතිබුණු අතර හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | හිඟහිටි සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කරන විට සේවක ණය ලේඛනය නිවැරදිව තුලනය කොට නිරවුල් කර සේවක ණය ශේෂ පිළිබඳව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිශ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.1,683,750ක් වූ ට්‍රැක්ටර් රථ 03ක් වර්ෂ 02කට වැඩි කාලයක් තිස්සේ ධාවනය නොකර නිශ්කාර්යව තිබුණි. | උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි වත්කම් උපයෝජනය කළ යුතු වේ. | ඉදිරියේදී බවුසරය මගින් ජලය බෙදා හැරීමට හා බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම සඳහා මෙම ට්‍රැක්ටර් රථ යොදා ගැනීමට නියමිත වේ. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් කාර්යාල ගොඩනැගිලි, පුස්තකාල සහ පෙර පාසල් පිහිටි ඉඩම් ඇතුළු සභාව විසින් භුක්ති විඳින ඉඩම් 22ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සභාව භුක්ති විඳින ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට අයත් කාර්යාලීය ගොඩනැගිලි, පුස්තකාල සහ පෙර පාසල් පිහිටි ඉඩම් ඇතුළු සභාව විසින් භුක්ති විඳින ඉඩම් පවරා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ සුභසාධනය, සෞඛ්‍ය සේවා, පුස්තකාල සේවා හා පෙර පාසල් කටයුතු සම්බන්ධ වැය විෂයයන් 49ක් වෙනුවෙන් සලසාගෙන තිබුණු රු.19,410,500ක ප්‍රතිපාදනය අදාළ කාර්යයන් සඳහා වියදම් නොකොට මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | අයවැය ඇස්තමේන්තු තාත්විකව සැකසීමට කටයුතු කළ යුතු වේ. | අයවැය මගින් යෝජිත කාර්යයන් ඉටුකිරීමේදී රටේ පවතින තීරණාත්මක නොවන අවස්ථාවන් උදා වූ හෙයින් එම සංවර්ධන කාර්යයන් ඉටුකිරීමට නොහැකි විය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද පෙර වර්ෂවලදී මෙන්ම ඉදිකිරීම්, වත්කම් කළමනාකරණය, මහජන සේවා සැපයීම වැනි ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන කාර්යාලය, උප කාර්යාල, | සභාවේ සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර විගණන කටයුතු සිදුකළ යුතු වේ. | 2020 වර්ෂයේදී විගණනය පෙන්වා දුන් පරිදි ඉදිකිරීම්, වත්කම් කළමනාකරණය, මහජන සේවා සැපයීම් වෙනුවෙන් ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

පුස්තකාල, පෙර පාසල් ඇතුළු ස්ථාන 20ක විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳව අභ්‍යන්තර විගණනය සිදු කිරීමට සැලසුම් කර තිබුණද 2019 ජූනි 04 දක්වා ස්ථාන 05ක පමණක් විගණන පරීක්ෂාවන් සිදුකර තිබුණි.